# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2306/08 - 2022 නොවැම්බර් මස 14 වැනි සඳුදා - 2022.11.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### කැස්බෑව නගර සහා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, ප්‍රසන්න රණතුංග වන මා හට 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8(ඊ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2022 අගෝස්තු මස 25 දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු, කැස්බෑව නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

ප්‍රසන්න රණතුංග (පා.ම.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 31 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

EOG 11-0132/1



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## කැස්බෑව නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තිය ප්‍රකාරව පිළියෙල කරන ලද, කැස්බෑව නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම, 2022 ක් වූ ඔක්තෝබර් මස 31 වැනි දින, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, එකී 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කළ බව, එකී පනතේ 8(උ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

**ප්‍රසන්න රණතුංග** (පා.ම.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2022 නොවැම්බර් මස 14 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

EOG 11-0132/2

---

## කැස්බෑව නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තියේ බලතල ප්‍රකාරව කැස්බෑව නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමා විසින්, එකී පනතේ 8 (ඊ) වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 ඔක්තෝබර් මස 31 දින අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

**නිමේෂ් හේරත්,**
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2022 නොවැම්බර් මස 14 වැනි දින,

EOG 11-0132/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.